# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/05/MF/08/01/චක්‍රලේඛණ | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................................ | දිනය<br>திகதி<br>Date | 2025.01.23 |
|---|---|---|---|---|---|

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :- 2025/02**

**සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,**
**පාලක මණ්ඩල/විධායක කමිටු සභාපතිවරුන්,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු/බැංකු සමිති කළමනාකරුවන් වෙත**

**<u>රක්ෂණ, විදුලිය, ජලය ඇතුළු සේවා සලසන ආයතන මගින් සැලසෙන සේවා වලට අදාල බිල්පත් / ලැබීම් වලට අදාල මුදල් රැස් කිරීම් භාර ගැනීමේ සේවාවන් පවත්වා ගෙන යාම.</u>**

**1.හැඳින්වීම.**

ශ්‍රී ලංකාව පුරා විසිර පවතින සමෘද්ධි බැංකු 1097කින් යුක්ත දිවයිනේ විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ජාලයක් සහිත පද්ධතිය සමෘද්ධි බැංකු වැඩසටහන වේ. අඩු ආදායම්ලාභීන් ඇතුළු ඉලක්කගත පිරිස් සඳහා ඉතුරුම් තැන්පතු ගිණුම් පවත්වාගෙන යාම, ව්‍යාපාරික හා වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ණය පහසුකම් ඇතුළු බොහෝ මූල්‍ය සේවා රැසක් ඉටු කරනු ලැබේ. සාමාජිකයින් මිලියන 4ක් පමණ වන සමෘද්ධි බැංකු ජාලය තුළ, ඉතුරුම් ගිණුම් හිමියන් මිලියන 10 ක් ද, ණයලාභීන් මිලියන 1.4 කට ආසන්න පිරිසක්ද, මේ වන විට සේවා සලසා ගනිමින් සිටී.

ඒ අනුව, සමෘද්ධි බැංකු වැඩසටහන මූල්‍ය හා භෞතික වශයෙන් ලබා ඇති ප්‍රගතිය හා අත්පත් කරගෙන ඇති ක්ෂුද්‍ර මූල්‍ය වෙළඳපළ කොටස මත රක්ෂණ ඇතුළු වෙනත් සේවා සලසන ආයතන විසින් තම සේවාවන් සමෘද්ධි බැංකු හරහා ජනතාව අතරට ගෙන යාමට එකඟතාවය පළකර ඇති අතර, ඒ අනුව සමෘද්ධි බැංකු හා බද්ධ වී මුදල් රැස් කිරීමේ කටයුතු සිදු කිරීමට කැමැත්තක් දක්වා ඇත.

මේ සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් ලබා ගත් තීරණ මත පහත සේවා සලසන ආයතනවල බිල්පත්, ලැබීම් හා රැස්කිරීම් සමෘද්ධි බැංකු විසින් සිදුකිරීමටත්, ඒ සඳහා බැංකු වලට සේවා ගාස්තුවක් ලබාගැනීමටත් අපේක්ෂා කර ඇත. මෙම සේවාව සැලසීම ඇතුළු මුදල් කටයුතු සිදුකිරීම සම්බන්ධව අවශ්‍ය අනුමැතිය හා උපදෙස් ලබා දීමට මෙම චක්‍රලේඛය නිකුත් කරන බව දන්වමි.

මෙම වැඩසටහන යටතේ දැනට අනුමත ආයතන පහත හඳුන්වා දී ඇති අතර, ඊට අදාල මුදල් එකතු කිරීම සිදුකළ යුතු ආකාරය සම්බන්ධ උපදෙස් මෙම ලිපිය මගින් ලබාදෙන අතර, අදාළ සේවා ගණුදෙනුකරුවන් අතරට ගෙන යාම සහ මුදල් රැස්කිරීම සිදුවිය යුතුය.

* රක්ෂණ වාරික/දායක මුදල්
* ජල බිල්පත් (දැනට ක්‍රියාත්මක නොවේ)
* විදුලි බිල්පත් (දැනට ක්‍රියාත්මක නොවේ)
* දුරකථන බිල්පත් (දැනට ක්‍රියාත්මක නොවේ)

මෙහිදී සමෘද්ධි බැංකු විසින් සම්බන්ධීකරණ කාර්යය හා මුදල් භාරගැනීම/ රැස් කිරීම පමණක් සිදුකළ යුතුය.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director (Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**02.** **මුදල් රැස් කිරීම හා ආයතනයට මුදල් යැවීම.**

2.1. යම් පුද්ගලයෙකු විසින් අවසරලත් ආයතනයකින් සේවාවක් ලබාගෙන ඊට අදාල මුදල් ගෙවීම් වාරිකය සමෘද්ධි බැංකුවට ලබාදුන් විටක එම මුදල් භාර ගැනීම සිදුකළ යුතුය. ඒ සඳහා ගිණුම් සටහන පහත වේ.

| | | |
|---|---|---|
| මුදල් ගිණුම | - | හර |
| අවසරලත් ආයතන වෙනුවෙන් ලැබීම් රැස් කිරීමේ ගිණුම | - | බැර |

පොදු ලෙජරයේ, වගකීම් පාර්ශවයේ ඇති Pay & Go ආයතනය වෙනුවෙන් ලැබීම් රැස් කිරීමේ ගිණුමෙහි (කේත අංක 4052) ඉහත සඳහන් පරිදි **"අවසරලත් ආයතනය වෙනුවෙන් ලැබීම් රැස්කිරීමේ ගිණුම"** ලෙස සංශෝධනය කර, ගිණුම් සටහන තැබිය යුතුය.

2.2 ඉහත ඡේද අංක 2.1 සඳහන් ගිණුම් සටහන තබා, ඇමුණුම 01 මඟින් හඳුන්වාදෙන රෙජිස්තරයක් අනුමත සෑම ආයතනයක් වෙනුවෙන්ම වෙන වෙනම පිළියෙල කර සටහන් තැබිය යුතුය.

2.3 රැස් කරන ලද මුදල් අදාල ආයතනයට ලබාදීම.

1. ආයතනය හඳුන්වා දෙන ජංගම ගිණුමට චෙක්පතකින් ලබා දිය යුතුය.චෙක්පතකින් ලබාදෙන විට ලියාපදිංචි තැපැලෙන් ආවරණ ලිපියක් යැවිය යුතුය.

2. රැස්කරන ලද මුදලින් බැංකුවට අයවිය යුතු කොමිස් / ගාස්තු අඩුකර ඉතිරි මුදල ලබාදීම සිදු කල යුතුය. (මේ සම්බන්ධව අදාළ ආයතන සමඟ පැමිණෙන එකඟතාවය අනුව කොමිස් / ගාස්තු අය කර ගැනීම සම්බන්ධව වැඩි විස්තර ලබාදීමට නියමිතය.)

3. මුදල් යැවීම හා කොමිස් / ගාස්තු අය කර ගැනීම

| | |
|---|---|
| අවසරලත් ආයතන වෙනුවෙන් ලැබීම් රැස් කිරීමේ ගිණුම | - හර |
| ලද ආදායම් මිශ්‍ර | - බැර (කේත අංක 1011) |
| ජංගම ගිණුම | - බැර (කේත අංක 3001) |

**03.** **අවසරලත් ආයතන හඳුන්වා දීම.**

I. දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදෙන ආයතන විසින් සිදුකරන සේවාවලට අදාල සේවාලාභීන් ලබාදෙන මුදල් රැස් කිරීම කළ යුතුව ඇත. වෙනත් කිසිදු ආයතනයකින් මුදල් රැස් කිරීමට බැංකුවට බලයක් නොමැත.

II. මෙම වැඩසටහන යටතේ, දෙපාර්තමේන්තුවේ නිසි පරිදි උපදෙස් හා අනුමැතිය නොමැතිව ගිවිසුම් /අවබෝධතා ගිවිසුම් වලට එළඹීමට බැංකුවට බලය නොමැත.

**04.** **ආයතන හඳුන්වාදීමට අදාල තොරතුරු**

I. පළමු පියවර යටතේ, සොෆ්ට් ලොජික් ලයිෆ් (soft logic) රක්ෂණ ආයතනය සමඟ ඇතිවූ එකඟතාවයක් මත, අදාල ආයතනය විසින් අලෙවි කරන ජීවිත රක්ෂණ ප්‍රාණ ඔප්පු වලට අදාල ආයතන මුදල් රැස් කිරීමට සමෘද්ධි බැංකුවට අවසර ලබාදෙනු ලැබේ.

II. බාහිර ආයතනයකින් රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු බවට චක්‍රලේඛ උපදෙස් ලබා දී ඇති ණය මුදල් සඳහා soft logic life රක්ෂණ ආයතනයෙන් රක්ෂණය සිදුකළ හැක. එම රක්ෂණය ණයකරුගේ කැමැත්ත හා එකඟතාවය මත සිදුකළ යුතු අතර, ඊට අදාල වාරිකය/දායක මුදල ඉහත සඳහන් පරිදි රැස් කිරීම සිදුකළ හැකිය.

III. මේ සම්බන්ධව දැනට සමෘද්ධි බැංකු දැනුවත් කර ඇති බවද දැනුම් දෙමි. තව දුරටත් විස්තර ලබා ගනීම සඳහා soft logic රක්ෂණ ආයතනයේ කළමනාකරු ඉන්දික උපුල් මහතා දු:අංක 077 3623973 අමතන්න.

05. දැනට soft logic ජීවිත රක්ෂණ ආයතනය අදාල රක්ෂණ වාරික/දායක මුදල් පමණක් මෙම වැඩසටහන යටතේ රැස් කිරීමට අවසර ඇත. ඉදිරියේදී මෙම සේවාව පුළුල් කර, අනෙකුත් ආයතන සමඟ එකඟතාවයන්ට එළඹීමට අපේක්ෂා කරන අතර, ඒ අනුව ඉදිරි උපදෙස් ලබාදීමට අපේක්ෂා කරනු ලබයි.

සී.ඩී.කළුආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. සියළුම දිස්ත්‍රික් ලේකම් / සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වරුන් - කා.දැ.ගැ.ස.
3. ප්‍රධාන ගණකාධිකාරි - කා.දැ.ගැ.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක - කා.දැ.ගැ.ස.
5. සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ ) පද්ධතියේ අවශය පහසුකම් සැලසීම - කා.දැ.ගැ.ස.
6. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කා.දැ.ගැ.ස.
7. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂක/සහකාර අධ්‍යක්ෂවරුන් - කා.දැ.ගැ.ස.

# අවසරලත් ආයතන වෙනුවෙන් ලැබීම් රැස්කිරීමේ ලෙජරය

ආයතනයේ නම:-

| අනු අංකය | සේවාලාභියාගේ නම(මුලකුරු සමග) | ලිපිනය | රක්ෂණ යෝජනා අංකය | රක්ෂණ ඔප්පු අංකය | හැඳුනුම් පත් අංකය | වාරික මුදල රු. | කොමිස් මුදල රු. | කොමිස් මුදල අඩුකල පසු වාරික මුදල රු. | ආයතනයට යැවූ :- | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | මුදල රු. | දිනය | නිලධාරි අත්සන |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |